# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 7 දරන
# ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා
# (සංශෝධන) පනත

---

[න්‍යාය පත්‍රයේ සටහන් කළේ 1980 ජනවාරි මස 24 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 පෙබරවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ: ශත 35 යි. තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1980 අංක 7 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 38/79.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 7 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනතේ 6 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් අලුත් උප වගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය :—

(අ) පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් කවර වූ හෝ ක්ෂේත්‍රයක විද්‍යාව සහ තාක්ෂණික විද්‍යාව පිළිබඳ විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් හඳුන්වනු ලබන) සාමාජිකයන් අට දෙනෙක් :—

ශුද්ධ විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, වන විද්‍යාව සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රයන්, කර්මාන්ත, අධ්‍යාපනය, ක්‍රම සම්පාදනය, වාරිමාර්ග සහ විදුලි බලය, භූ විද්‍යාව, සමාජ විද්‍යාව සහ ජාතික සංවර්ධනයට, විද්‍යාව සහ තාක්ෂණික විද්‍යාව යොදා ගැනීම සම්බන්ධයෙන් අදාළ වන කිසියම් වෙනත් ක්ෂේත්‍ර ; සහ

(ආ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් තුන් දෙනෙක්, එනම්—

(i) සභාවේ මහා ලේකම්වරයා ;

(ii) විද්‍යා කටයුතු පිළිබඳ විෂයය පවරනු ලැබ සිටින අමාත්‍යවරයාගේ භාරයේ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නාම කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ; සහ

(iii) මුදල් විෂයය පවරනු ලැබ සිටින අමාත්‍ය වරයාගේ භාරයේ ඇති අමාත්‍යාංශයේ ලේකම් වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නාම කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්.",

2—ඒ 46493—10,550 (79/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

16. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ සිටින අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, තීරණය කරනු ලබන පාරිශ්‍රමික සභාවේ අරමුදලින් සියලුම සාමාජිකයන්ට හෝ ඔවුන් අතුරින් යම් සාමාජිකයකුට හෝ ගෙවනු ලැබිය හැකි ය. ".